# 23

## ශ්‍රී ලාංකික මුස්ලිම් නායකයින් - I

# මුහම්මදු කාසිම් සිද්දි ලෙබ්බේ

**අධ්‍යාපනය යනු භාෂාව කියවා දැන ගැනීම පමණක් ම නොවේ. එය මානසික පෑථුල භාවය හා නිරවුල් බවට සහය වේ. අල් කුර්ආනයේ ඇති දේශනා අවබෝධ කර ගෙන එය අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙය තේරුම් ගෙන නැති පුද්ගලයින් තමන් ම රවටා ගත්තවුන් ය. (සිද්දි ලෙබ්බේ)**



අධිරාජ්‍ය පාලන සමයේ දී ශ්‍රී ලාංකිකයන්ගේ පිබිදීමට උර දුන් අනගාරික ධර්මපාල තුමා (1864-1933) වැනි සිංහල නායකයන් සමග ආරුමුග නාවලර් තුමා (1822-1879) හා සිද්දි ලෙබ්බේ තුමා (1838-1898) වැනි දෙමළ, මුස්ලිම් නායකයන් ද සුවිශේෂී සේවයක් ඉටු කළ හ.

ශ්‍රී ලංකික මුස්ලිම් ජනයාගේ පිබිදීමට නායකත්වය දුන් මුහම්මදු කාසිම් සිද්දි ලෙබ්බේ නම් වූ විද්වතා උපත ලැබුවේ 1838 ජූනි මස 11වන දින නුවර දී ය. මෙතුමා පැවත එන්නේ අරාබි පරම්පරාවකින් බව සැලකේ. අරාබියේ සිට වෙළඳාම අරමුණු කරගෙන ලංකාවට පැමිණි මුල්ක් රහ්මතුල්ලාහ් නැමැත්තා අලුත්ගම ප්‍රදේශයේ පදිංචි වූ අතර ලාංකික කාන්තාවක් විවාහ කර ගත්තේ ය.

මුල්ක් රහ්මතුල්ලාහ්ගේ පුතණුවන් වන මුහම්මදු ලෙබ්බේ නැමැත්තා ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලයේ දී වෙළෙඳාම අරමුණු කරගෙන මහනුවර පදිංචි වී සිටියේ ය. ඔහුගේ පුතා සිද්දි ලෙබ්බේ වේ.

බ්‍රිතාන්‍ය ආක්‍රමණිකයන් මහනුවර අත්පත් කර ගැනීමෙන් පසු ඔවුහු ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දීම සඳහා පාසලක් ආරම්භ කළහ. මෙම පාසලේ අධ්‍යාපනය හැදෑරූ මුහම්මදු ලෙබ්බේ මනා දැනුම් සම්භාරයක් සහිත මනා පවුල් පසුබිමකින් යුතු පුද්ගලයකු වීම හේතුවෙන් එකල බ්‍රිතාන්‍ය රජය නීතිඥයකු ලෙස ඔහු 1833 දී පත් කෙරිණි. නීතිඥයකු ලෙස පත් වූ ප්‍රථම ශ්‍රී ලාංකික මුස්ලිම් ජාතිකයා ද ඔහු වේ. එකල ශ්‍රී ලාංකාව තුළ පළ වූ "සිලෝන් ඇල්මනැක්"නම් වූ පුවත් පත ලංකා යෝනකයන්ගේ නායකයා ලෙස ද ඔහු හඳුන්වා තිබුණි.

මුහම්මදු කාසිම් සිද්දි ලෙබ්බේ, මුහම්මදු ලෙබ්බේ දව උපන් පුතුන් අතරින් තුන්වැන්නා වේ.

සිද්දි ලෙබ්බේ තුමාගේ පවුල සහෝදර සහෝදරියන් පස් දෙනෙකුගෙන් සමන්විත විය. එහි දෙදෙනකු ගැහැනු වූ අතර තිදෙනකු පිරිමි විය. ඔවුහු පස්දෙනා ම දැනුමෙන් පෝෂිත අරාබි භාෂාව ප්‍රගුණ කළ, හා ආගමික දැනුමින් සන්නද්ධ වූවෝ ලෙසට හඳුනාලනු ලැබූහ. සිද්දි ලෙබ්බේ තුමාගේ වැඩිමහල් සහෝදරයා වූ මුහම්මදු ලෙබ්බේ ආලිම් වරයකු මෙන් ම නීතිඥයකු ද වූවේ ය. මෙතුමා මුස්ලිම්වරුන්ට නායකත්වය දුන්නේ ය. මුස්ලිම්වරුන්ගේ දික්කසාද නඩු විභාග කරන කාලි විනිශ්චයකරුවකු වශයෙන් ද මෙතුමා පත් කරන ලදි. මෙතුමා ජීවත් වූ ප්‍රදේශයේ ජනයා 'මරයික්කායර්' යන නමින් මෙතුමා හැඳින්වූ අතර කවියකු ලෙස ද ප්‍රචලිත ව සිටියේ ය. මෙතුමා කවි 300කට අධික ප්‍රමාණයක් රචනා කර ඇත. සිද්දි ලෙබ්බේ තුමාගේ සහෝදරිය වූ මුත්තු නාච්චියා ආලිමාවරියක් ලෙස ප්‍රකට වූවා ය. ඇය නුවර ත්‍රිකුණාමල පාරේ සිද්දි ලෙබ්බේ තුමා විසින් ඇරඹූ මුස්ලිම් බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය වශයෙන් කටයුතු කළා ය.

සිද්දි ලෙබ්බේ තම වැඩිමල් සොයුරාගෙන් අල් කුර්ආනය පාරායනය කිරීමට ද හා අරාබි, දෙමළ හා සිංහල භාෂා ද ඉගෙන ගත්තේ ය. පසු කලෙක මහනුවර ඉංග්‍රීසි මාධ්‍ය පාසලක අධ්‍යාපනය ලැබුවේ ය. මෙකල අකුරණ ප්‍රදේශයේ ජීවත් වූ කසාවත්ත ආලිම් අප්පා නම් වු සෙයිගු මුහම්මද් ආලිම් වෙත ගොස් අරාබි භාෂාව උගෙන තව දුරටත් ප්‍රගුණ කළ සිද්දි ලෙබ්බේ මැතිඳු, තම භාෂා ප්‍රවීණතාව මේ අයුරින් තව දුරටත් වර්ධනය කර ගත්තේ ය.

කායල්පට්ටිනම් සිට පැමිණ මහනුවර විසූ අබ්දුල් කාදිර් මීයාප් පිල්ලයි නැමැත්තාගේ දියණිය වූ සෙයියිද උම්මා නැමැත්තිය (ක්‍රි.ව. 1871 දී ) විවාහ කර ගත්තේ ය. මැය අල් කුර්ආනය හොඳින් හදාර තිබුණා ය. දෙමළ, ඉංග්‍රීසි වැනි භාෂා ද ප්‍රගුණ කර තිබූ ඇය මැහුම්, ගෙතුම් ශිල්ප කලාවන්හි ද කුසලතාවන්ගෙන් ද හෙබි වූවා ය. පියානෝව ගිටාරය වැනි සංගීත භාණ්ඩ වාදනයට ද දස්කම් පෑ ඇය අල් කුර්ආනය පිළිබඳ දැනුමෙන් හා නව ලොව අධ්‍යාපනයෙන් සන්නද්ධ වූවා ය. තම ස්වාමියාගේ අදහස්වලට සරිලන අයුරින් එක් ව කටයුතු කිරීමටත් ඔහුගේ පෙරටුගාමී සැලසුම්වල දී සහය වීමට ද ඇයට හැකි විය. එතුමන්ට දරුවන් නොමැති වූයෙන් අබ්දුල් හමීඩ් යන නමින් දරුවකු හද ගත්තේ ය.

1862 වසරේ දී මහනුවර දිස්ත්‍රික්කයේ නීතිඥයකු ලෙසට පත්වීම් ලැබූ සිද්දි ලෙබ්බේ තුමා 1864 දී මහ අධිකරණ නීතිඥයකු ලෙසට උසස්වීමක් ලැබුවේ ය. මහනුවර මහනගර සභාවේ අධිකරණ විනිසුරු වරයකු ලෙස සේවය කිරීමට ද මෙතුමාට අවස්ථාව හිමි විය. 1874 සිට 1878 දක්වා මහ නගර සභා අධිකරණ විනිසුරුවරයකු ලෙස විටින් විට සේවය කළේ ය. වසර 8 ක කාලයක් මහනගර සභා සභිකයකු ලෙස ද, කටයුතු කළ මෙතුමා 1884-87 දක්වා කොළඹ ප්‍රදේශයේ පදිංචි වූ නමුත් නැවත මහනුවර පදිංචි වී ජීවත් වූයේ ය.

සමාජ සේවා ක්‍රියාකාරකම්වල නිරත වීමේ ද සමාජය දියුණු කිරීමේ ද අධික උනන්දුවක් දක්වූ සිද්දි ලෙබ්බේ තුමා නීතිඥ වෘත්තියෙන් තෘප්තිමත් වූයේ නැත. එකල ශ්‍රී ලංකා මුස්ලිම් ජනයාගේ අධ්‍යාපනය හා ආගමික කටයුතු සම්බන්ධයෙන් ඉතා දුර්වල

තත්ත්වයක සිටිනු දුටු එතුමා බොහෝ සෙයින් දුක් වූවේ ය. එහෙයින් ක්‍රි. ව. 1882 දෙසැම්බර් මස 12 දින "මුස්ලිම් නේසන්" නමින් පුවත් පතක් ආරම්භ කර ආගමික පරිසරය සංවර්ධනය වීමේ හා අධ්‍යාපනයේ වැදගත්කම අවධාරණය කිරීමට මෙන් ම තමා සමාජයේ දියුණුව උදෙසා ගනු ලබන ක්‍රියා මාර්ග පිළිබඳ දැනුම්වත් කිරීමට මෙම පුවත්පත මාධයයක් කර ගත්තේ ය. මෙම පුවත් පත එළි දැකීමත් සමඟ ම ශ්‍රී ලංකාවේ ප්‍රථම මුස්ලිම් පුවත් පත් වේදියා යන ගෞරවය හිමි කර ගැනීමට ද ඔහුට හැකි විය.

විප්ලවයේ වීරයා ඔරාබි භාෂා ඊජිප්තුවෙන් පිටුවහල් කර ලංකාව පැමිණි අවස්ථාවේ එතුමා පිළිගැනීම නොකරන්න යැයි, රජය පුවත්පත් මගින් ඉල්ලීම් කරන ලදි. මෙම තහනම නොතකා මෙතුමාගේ පෞද්ගලික උත්සාහයෙන් මුස්ලිම් ජනයා එක්රොක් කොටගෙන වරායට ගොස් එතුමා පිළිගෙන සංග්‍රහය කළේ ය. මෙතුමාගේ ක්‍රියා කලාපය දෝෂ දර්ශනයට ලක් කර පුවත් ආවත් එතුමා ඒ ගැන සැලකුවේ නොමැත.

හොඳ ආගමික දැනුමක් තිබෙන වැඩිමල් සහෝදරයාගේ මගපෙන්වීම ද කසාවත්ත ආලිම් අප්පා හා යෙමන් දේශයේ ආගමික නායක වූ අබ්දුල්ලා බාදීප් වැනි අයගේ සබඳතා සිද්දි ලෙබ්බෙගේ ආධ්‍යාත්මික පැති තර කළේ ය. තවත් පැත්තකින් ඊජිප්තුවෙන් පිටුවහල් කරන ලද ඔරාබි භාෂා, ජාත්‍යන්තර මුස්ලිම්වරුන්ගේ ඒකීයභාවයට හා එකමුතුකමට හඬ නැගූ ජමාලුද්දීන් අෆ්ගානි, මුස්ලිම් අධ්‍යාපනය හා සමාජ උන්නතිය තකා කැපවුණු ශ්‍රීමත් සෙයියිත් අහ්මද් කාන් වැනි අයගේ චින්තනයේ බලපෑම් ප්‍රතිගාමී නිවැරදි චින්තන එතුමා තුළ වර්ධනය වීමට හේතු විය. මේ චින්තන රටා දෙක ම පැහැදිලි ව සිද්දි ලෙබ්බේ තුමාගේ නිර්මාණවල ගැබ් වී ඇත.

වාප්පිච්චි මරික්කාර් සමග එක් ව සිද්දි ලෙබ්බේ විසින් ආරම්භ කළ අධ්‍යාපන සංවර්ධන සංගමයට ඔහුගේ සේවාව අඛණ්ඩ ව වුවමනා වී තිබුණු නිසා කොළඹ පදිංචි වීමේ අවශ්‍යතාව ඔහුට ඇති විය. ලාංකික මුස්ලිම්වරුවන් දැනුම්වත් කිරීම උදෙසා පුවත්පත "මුස්ලිම් නේසන්" සහ "ඥානදීපය" නම් සඟරාව එළ කිරීමට මුල් විය. මෙම මාධ්‍ය දෙක ම ඉස්ලාම් දහම සම්බන්ධ සවිස්තරාත්මක තොරතුරු මහජනතාව වෙත ලබා දීමට උපකාරී විය. ඉස්ලාම් දහමේ වැඩි දුර අධ්‍යයනයේ දී අරාබි භාෂාව වැදගත් වන අයුරු මේ මාධ්‍ය දෙක උපයෝගී කරගෙන අවධාරණය කරනු ලැබී ය. ඉස්ලාමය දැන ගැනීමට නම් අරාබි භාෂාවේ වැදගත්කම ගැන විග්‍රහ කර එය ඉගෙන ගත යුතු යන අවශ්‍යතාව පළ කළේ ය.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මුස්ලිම්වරුන් පසුබෑමට ලක් වී සිටි කාල වකවානුවක දී මුස්ලිම් ප්‍රජාවේ දියුණුව ළඟා කර ගැනීමට අධ්‍යාපනය වැදගත් වන බව තම දේශනා මෙන් ම පුවත් පත් සඟරාවල පළ කරන ලද ලිපි මගින් අධික ලෙස අවධාරණය කළේ ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ සහිරා විදුහල බිහි විය. වාපිච්චි මරික්කාර් වැනි ධානපතීන්ගේ සහයෝගය විදුහලේ පරිපාලන කටයුතු සඳහා ලබා ගැනීමට ඔහු සමත් විය.

මුස්ලිම්වරුන් බහුල වශයෙන් ජීවත්වන කොළඹ, නුවර, චුන්නාගම්, ගම්පොළ, පොල්ගහවෙල, කුරුණෑගල, බදුල්ල, ගාල්ල, මාතර යනාදි පෙදෙස්වල පාසල් පිහිටුවීම පමණක් නොව මීට ඒ ඒ ප්‍රදේශයේ විසූ මුස්ලිම් ප්‍රමුඛයන්ගේ ද අධ්‍යාපන දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් ද සහයෝගය ලබා ගත්තේ ය.

මෙම වකවානුවල මුස්ලිම් කාන්තාවන්ගේ අධ්‍යාපනයේ දියුණුව පිළිබඳ අවධානය කළ සිද්දි ලෙබ්බේ මහනුවර නගරයේ ත්‍රිකුණාමල පාර, කටුකැලේ කඩවීදිය පාර හා කුරුණෑගල යනාදි ස්ථානවල මුස්ලිම් බාලිකාවන්ට පෞද්ගලික පාසල් තුනක් ගොඩනගන ලදි. මෙම පාසල්වල අල් කුර්ආනය, අරාබි භාෂාව යන විෂයයන්ට අමතර ව දෙමළ, ඉංග්‍රීසි, ගණිතය, මැහුම් යනාදි විෂයයන් උගන්වන ලදි. සිද්දි ලෙබ්බේ තුමාගේ මෙම ක්‍රියාවලිය ගැන තෘප්තිමත් වූ ආණ්ඩුකාර හැවලොක් 1892 දී මෙම පාසල් නිරීක්ෂණය සඳහා ද පැමිණියේ ය.

සිද්දි ලෙබ්බේ තමාගේ සමාජ මෙහෙවර පාසල් පිහිටුවීමට පමණක් සීමා වී නොමැත. තමා විසින් මෙහෙයවන ලද මුස්ලිම් නේසන් මගින් ගුරු සිසුන්ට මග පෙන්වීම ලබා දුන්නේ ය. පාසල්වලට වුවමනා විෂය මාලාව ලබා දී වුවමනා පෙළපොත් ද ලියා නිකුත් කළේ ය. ඉස්ලාමීය පසුබිමක නවීන අධ්‍යාපනය ලබා ගැනීම කාලෝචිත බව පැවසූ අතර ම අප රට මුස්ලිම්වරුන් අරාබි, දෙමළ, ඉංග්‍රීසි, සිංහල යනාදි සිව් භාෂා හැකියාවන් ලබාගත යුතු ය, යන්නත් ප්‍රකාශ කර සිටියේ ය. අරාබි භාෂාව මුස්ලිම්වරුන්ගේ නිවෙසේ භාවිත වන භාෂාව ලෙසට තිබිය යුතු ය, යන අපේක්ෂාව ඔහු තුළ විය. තව ද මව් භාෂාව වන දෙමළ භාෂාව නොදන්නා පුද්ගලයා අන්ධයකුට සංසන්දනය කළේ ය.

නවකතා සාහිත්‍ය කෙරෙහි සිද්දි ලෙබ්බේ තුමාගේ තිබුණු ලැදියාව ඉමහත් ය. මෙතුමා විසින් ලියා නිකුත් වුණු "අසන්බේ සරිත්තිරම්" ලංකාවේ ප්‍රකාශයට පත් පළමු දෙමළ නවකතාව ලෙස සැලකේ. 1885 දී මෙය ග්‍රන්ථයක් ලෙස පිටවුණි. ආශ්චර්යවත් කථා සහ ඒ තුළ අතුරු කතා යනාදිය ගැබ් වී තිබෙන මෙම නවකථාව සමාජයේ අඩුපාඩු පෙන්වා දෙන අතර මුස්ලිම් සමාජය ප්‍රබෝධවත් කිරීමට ඉලක්කය වශයෙන් ක්‍රියාත්මක විය.

පුවත්පත සම්බන්ධයෙන් සිද්දි ලෙබ්බේ තුමාගේ දැක්ම පැහැදිලිව දිස් විය. සමාජයක් දියුණු කිරීමට නම් පුවත්පතකට කුමන භූමිකාවක් කළ හැකි ද යන්න ගැන මෙතුමා නිවැරදි ව හඳුනා ගෙන තිබුණේ ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙතුමාගේ "මුස්ලිම් නේසන්" පුවත් පත පළ විය. 1882 - 1944 දක්වා අඛණ්ඩව නිකුත් වූ මෙම පුවත්පත මුස්ලිම් සමාජයේ වුවමනා හා හැඟීම් නියෝජනය වන පුවත්පත පමණක් නොව ඒවා නිරාකරණය කිරීමට සටන් වදින ආයුධය බවට ද පත් විය.


සිද්දි ලෙබ්බේ තුමාගේ කාලයේ විසූ මුස්ලිම්වරු අපැහැදිලි නිසා ඉස්ලාම් අධ්‍යාත්මික ක්ෂේත්‍රයේ ඉතා දුබල තත්ත්වයට පත් වී සිටියහ. ලෞකික හා අධ්‍යාත්මික යනාදි ක්ෂේත්‍ර දෙකින් ම පෝෂණය කළ මෙතුමා මෙම තත්වයෙන් මොවුන්ව මුදවා ගැනීමේ පරමාර්ථයෙන් ඥානදීපම් යන පුවත්පත 1892 හි පළ කළේ ය.

මුස්ලිම්වරුන්ගේ සමාජ හා අධ්‍යාපන දියුණුව පමණක් නොව දේශපාලන අයිතිවාසිකම් ජයග්‍රහණ ලබා ගැනීමට ද අවධානය යොමු කළේ ය. දේශපාලන අයිතිවාසිකම් අහිමි වන නිසා ඇති වන හානි හොඳින් දැන සිටි මොහු ඒවා ජයග්‍රහණය කරන මාධ්‍යයක් ලෙස "මුස්ලිම් නේසන්" පුවත්පත හා උපදෙස් ද ඇති කර ගත්තේ ය. මේ නිසා සංවේදි වූ මුස්ලිම්වරු 1880 දී මන්ත්‍රණ සභාවේ මුස්ලිම්වරුන්ට නියෝජනය ලබා දිය යුතු යි, යන ඉල්ලීම් ආණ්ඩුකාරවරයාට ඉදිරිපත් කළෝ ය. මේ නිසා 1889 දී එම්. සී. අබ්දුර් රහ්මාන් මන්ත්‍රණ සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදි.

සිද්දි ලෙබ්බෙ තුමාගේ සේවා අතර ශ්‍රී ලාංකික මුස්ලිම් ප්‍රජාවේ විවාහ ලියාපදිංචි කිරීමේ ක්‍රමය පිළිබඳ ඔහුගේ දායකත්වය ඉතා අගනේ ය. විවාහ ලියපදිංචි කිරීම ක්‍රමානුකූල ව සිදු නොවීම නිසා ඇති විය හැකි බරපතල තත්ත්ව පිළිබඳ මුස්ලිම් නේසන් මගින් හෙළි කළ අතර එලෙස නීත්‍යානුකූල විවාහ ලියාපදිංචි වීමේ අවශ්‍යතාව අවධාරණය කළේ ය. මෙම ප්‍රයත්නය ඵල දැරුවේ 1928 වර්ශයේ දී පත් කරන ලද අක්බාර් කමිටුවේ නිර්දේශ මත 1935 දී ක්‍රියාත්මක වීමත් සමඟ ය.

ආගමික හා සමාජීය මෙහෙවර අතර සමාජයේ තිබුණු අශීලාචාර ගතිගුණ තුරන් කිරීමට සිද්දි ලෙබ්බෙ තුමාගේ ප්‍රයත්නය විශිෂ්ට ය. සිංහල රජවරුන්ගේ කාලයේ තිබුණු යහපත් ආගමික වට පිටාව යුරෝපා අධිරාජ්‍යවාදීන් සැලසුම් කර විනාශ කළහ. මේ නිසා ලාංකික මුස්ලිම් ජනයා දකුණු ඉන්දියානු සංස්කෘතික බලපෑම්වලට ලක් වූහ. මේ තත්ත්වය නිසා මිත්‍යා විශ්වාස හා සිරිත් විරිත් ලාංකික මුස්ලිම් ජන සමාජයට ප්‍රවිශ්ට වීමට මග පෑදුනි. මේවා මුලිනුපුටා දමා සමාජය දියුණු කිරීමට සිද්දි ලෙබ්බෙ, තුමා විසින් පළ කරන ලද මුස්ලිම් නේසන් පුවත්පත මනා ලෙස හැසුරුවා ගත්තේ ය.

මේ අයුරින් ශ්‍රී ලාංකික මුස්ලිම් ප්‍රජාව අනෙකුත් ජන සමාජ මෙන් ම විවිධ අංශ වලින් දියුණු විය යුතු බවට විශ්වාස කර ඒ වෙනුනේ වෙහෙස වූ සිද්දි ලෙබ්බෙ තුමාගේ චින්තනය හා ක්‍රියාකාරකම් නිසා ඔහුට ජාතික මට්ටමින් ඉමහත් සහයක් ලැබුණ අතර විරෝධතා ද ඇති විය. මෙතුමන්ගේ සමාජ විශුද්ධිකරණ මෙහෙවර එක් පැත්තකින් අධ්‍යාපනය ලත් ජනයාගේ සිත් ආකර්ෂණය කර ගැනීමට සමත් විය. තවත් පැත්තකින් පැරණි මිත්‍යා මත දරීන්ගේ හා සමාජයේ ගෞරවයට පාත්‍ර වූ සමහරකගේ ද විරෝධතා මතු වීමට ද හේතු කාරක විය. නමුත් එවැනි විරෝධතා දැක බිය නොවූ මෙතුමා තම මෙහෙය තවදුරටත් අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේ ය.




මුස්ලිම් ජන සමාජය විවිධ මට්ටමින් පුනරුත්තාථනය කළ පුනරුදයේ පියා මුහම්මදු කාසිම් සිද්දි ලෙබ්බෙ තුමා 1898 වසරේ දී තම 60 වන වියේ දී ඇදුම රෝගයට ගොදුරු වී අප අතරින් සමු ගත්තේ ය. තුන්දහකටත් අධික පිරිසක් මෙතුමාගේ ජනාසා සලාතය සඳහා සහභාගී වූ අතර ජනාසා භූමදනය මහයියාව කැලේ පල්ලිය කනත්තේ දී සිදු කරන ලදි. මෙතුමා අනුස්මරණය කිරීම උදෙසා ශ්‍රී ලාංකික රජය 1977.01.11 වැනි දින තැපැල් මුද්දරයක් ද නිකුත් කරන ලදි.

**අභ්‍යාසය**

1. ශ්‍රී ලාංකික මුස්ලිම් ජනයාගේ පිබිදීමට නායකත්වය දුන් පුරෝගාමියකු වශයෙන් සිද්දි ලෙබ්බෙ මැතිදුන් මුස්ලිම් සමාජය වෙනුවෙන් ඉටු කළ සෙවය ලැයිස්තු ගත කරන්න.

2. සිද්දි ලෙබ්බෙ තුමාගේ කාලයේ දී මුස්ලිම්වරුන් කුමන අයුරකින් දකුණු ඉන්දියානු සංස්කෘතික බලපෑමට ලක්වූවා ද ?